4th International Conference of Multidisciplinary Approaches (iCMA), 2017
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka

ISSN: 2386 – 1509
Copyright © iCMA


# පඤ්චතන්ත්‍රාගත ආර්ථික ක්‍රමෝපාය කිහිපයක් පිළිබඳ විග්‍රහයක්

වැල්ලවායේ නන්දරතන හිමි

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය
wnandarathana611@gmail.com

ධනය යනු මිනිසාගේ ජීවන ප්‍රවෘත්තියට අතිශය වැදගත් අංගයක් වන අතර එය ඉපයීම සඳහා සමාජයක විවිධ ක්‍රමෝපාය පවතී. එම ධනෝපාය ක්‍රම කාලානුරූපී ව විවිධ විපර්යාසයන්ට බඳුන් වීම ලෝක ප්‍රවෘත්තියේ සාමාන්‍ය සංසිද්ධියකි. සංස්කෘත සාහිත්‍යයේ ඉතා සුප්‍රකට සමාජ විශ්ලේෂකයකු මෙන් ම නීතිශාස්ත්‍රඥයකු වශයෙන් පෙන්වාදිය හැකි විෂ්ණුශර්මන් පඬිතුමා කාලීන වශයෙන් සමාජයේ පැවති විවිධ පැතිකඩ විමර්ශනයට ලක් කොට ඇති විද්වතෙකි. ඔහු විසින් විරචිත පඤ්චතන්ත්‍ර නම් කෘතිය පෙරදිග මෙන් ම අපරදිග වියතුන්ගේ විශේෂ අවධානයට ලක් වූ විශිෂ්ට උපදේශ කෘතියක් වන අතර, ඉතා සරල ආකාරයෙන් රාජ්‍ය පාලනානුබද්ධ නීතිශාස්ත්‍රය මෙන් ම අර්ථශාස්ත්‍රය පිළිබඳ කරුණු සාකච්ඡා කොට ඇති කෘතියක් ද වේ. එහිදී මිත්‍රභේදය, මිත්‍රප්‍රාප්තිය, ලබ්ධප්‍රණාශය, කාකෝලූකීය, අපරීක්ෂිතකාරක යන තන්ත්‍ර පහකින් යුක්ත සිය කෘතියෙහි මිත්‍රභේදය නම් කොටස යටතේ ධන ක්‍රමෝපාය කිහිපයක් කෙරෙහි විෂ්ණුශර්මන්ගේ විශේෂ අවධානය යොමු වී ඇත. එනම් සිඟා කෑම, රාජ්‍ය සේවය, ගුරු වෘත්තිය, මුදල් පොළියට දීම, කෘෂිකර්මාන්තය, වෙළෙඳාම වශයෙනි. ඒ අනුව තද් ආර්ථික ක්‍රමෝපායන් අතුරින් ඉතා සාර්ථක ධනෝපාය ක්‍රමවේදය කවරක් ද යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුව යි. යථෝක්ත ධනෝපාය ක්‍රමවේද පිළිබඳ හා එවායේ ආවේණික ලක්ෂණ විමර්ශනය කිරීම හා සමස්ත ධනෝපාය ක්‍රමවේදයන් අතුරින් විෂ්ණුශර්මන් පෙන්වා දී ඇති සුවිශේෂ ධනෝපාය ක්‍රමවේදය කවරක් ද යන්න පෙන්වාදීම මෙහි පර්යේෂණ අරමුණ වේ. ඒ ඒ වෘත්තීන්ට ස්වභාවයෙන් ආවේණික දුක් ගැහැට හා සුවතාව සම්බන්ධ ව විෂ්ණුශර්මන් විසින් සිය කෘතියෙහි වෙන් වෙන් වශයෙන් කරුණු පැහැදිලි කොට ඇති අතර, ඒවායේ ස්වභාව ලක්ෂණ පැහැදිලි ව හඳුනා ගැනීමේ අවකාශය ද ඒ අනුව ලැබී ඇත. සමස්තයක් ලෙස පරාධීන නොවී සුවිශේෂ ප්‍රතිලාභයන් ලැබිය හැකි ඉතා සාර්ථක ධනෝපාය ක්‍රමය වෙළෙඳාම යන්න විෂ්ණුශර්මන්ගේ නිගමනය යි. තව ද දේශාන්තරයන්හි සඤ්චාරය කරමින් ආනයන හා අපනයන ක්‍රමවේදය ඔස්සේ වෙළෙඳාම් කිරීම මගින් ඉතා විශාල ධනෝපායක් මෙන් ම නිරවුල් හා ස්වාධීන වූ නිදහසක් ද උරුම වෙන අයුරු වැඩිදුරටත් ප්‍රකට කොට ඇත. ඒ අනුව පඤ්චතන්ත්‍රාගත මිත්‍රභේදය නම් කොටසෙහි දැකිය හැකි මෙම ආර්ථික විග්‍රහය අතීතයට මෙන් ම වර්තමානයට ද යෝග්‍ය ආර්ථික විග්‍රහයක් බව කරුණු විමසීමෙන් තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ විෂ්ණුශර්මන්, පඤ්චතන්ත්‍රය, මිත්‍රභේදය, නීතිශාස්ත්‍රය, අර්ථශාස්ත්‍රය, ධනෝපාය ක්‍රම, වෙළෙඳාම